## උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ, අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ හා නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරු වලට පත්කිරීම සඳහා අයදුම්පත් කැඳවීම.

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයට අයත් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් නිලධාරින්ගෙන් දීපව්‍යාප්තව අයදුම්පත් කඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | තනතුර අයත් සේවය හා ශ්‍රේණිය | සුදුසුකම් | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. | පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය I ශ්‍රේණිය | • ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.<br>• I වන ශ්‍රේණියේ වසර 03 ක පළපුරුද්ද සහිත නිලධාරියෙකු වීම.<br>• කෘෂි සංවර්ධන ධාරාවට අයත් නිලධාරියෙකු වීම | 01 |
| 02. | අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය I ශ්‍රේණිය | • ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.<br>• I වන ශ්‍රේණියේ වසර 03 ක පළපුරුද්ද සහිත නිලධාරියෙකු වීම.<br>• කෘෂි සංවර්ධන ධාරාවට අයත් නිලධාරියෙකු වීම | 01 |
| 03. | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය II ශ්‍රේණිය | • ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.<br>• II වන ශේණියේ වසර 03 ක පළපුරුද්ද සහිත නිලධාරියෙකු වීම.<br>• කෘෂි සංවර්ධන ධාරාවට අයත් නිලධාරියෙකු වීම | 03 |

02. වෙනත් සුදුසුකම්

I අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න 05 වසරක කාල සීමාව තුළ විනය කටයුත්තකට හෝ විනය දඩුවමකට භාජනය නොවූ අයෙකු විය යුතුය

II වයස් සීමාවන් අදාල නොවේ

III අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට පත්කිරීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

IV අයදුම්පත් කැඳවන දිනට ආසන්න වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් පැවතීම හා වැටුප් වර්ධක උපයා ගෙන තිබීම.

සටහන - සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතික වල සහතික කරන ලද ඡායා පිටපත් ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

03. බඳවා ගැනීමේ ක්‍රමය

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ අදාල ශ්‍රේණිවලට අයත් අයදුම්කරුවන් අතුරින් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කරනු ලැබ ඇති ලකුණු පටිපාටිය අනුව පිරිනමා ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ. (ලකුණු ලබා දීමේ පටිපාටි ඇමුණුම I,II, III )

04. වෙනත් කොන්දේසි

I. 2014.09.19 දිනැති අංක 1880/26 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ හා අංක 1971/17 රණ 2016 ජුනි 15 දින නිකුත් වූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය අතිවිශේෂ ලැසට් පත්‍රෙය් පළ වූ ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ කොන්දේසි හා උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා 2013.01.01 දිනට අනුමත කාර්ය මණ්ඩල වාර්තාවේ සඳහන් කරුණු මෙම බඳවා ගැනීම සඳහා බල පවත්වනු ලැබේ.

II. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට හා මුදල් රෙගුලාසි වලට ද දෙපාර්තමේන්තු නියෝග වලටද රජය හා උතුරු මැද පළාත් සභාව දැනට නිකුත් කර ඇත්තා වූ ද ඉදිරියේදී නිකුත් කරනු ලබන්නා වූද රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව ක්‍රියා කල යුතුයි.

III. මෙම බඳවා ගැනිමේ නිවේදනයේ විධි විධාන සලසා නැති කරුණු සම්බන්ධයෙන් ගැටළුවක් මතු වුවහොත් උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාර තුමාගේ එකඟතාවය ඇතිව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව එම ගැටළු සම්බන්ධයෙන් අවසන් තීරණය ගනු ලැබේ.

05. අයදුම්පත් ඉදිරිපත් කිරීම.

I. සියළුම අයදුම්පත් ඇමුණුම IV අනුව සකස් කර විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හා අදාළ අමාත්‍යාශ ලේකම්ගේ/කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ සහිතව 2026.03.06 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුයි.

II. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ "(ඉල්ලුම් කරන තනතුර සඳහන් කරන්න) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම " යනුවෙන් සඳහන් කල යුතුයි.

III. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවිමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IV. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාරගනු නොලැබේ.

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත,
අනුරාධපුර.
2026.02.13

ඇමුණුම I

## පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කිරීමේ ලකුණු ලබා දීමේ යෝජනා ක්‍රමය (මුළු ලකුණු100)

| නිර්නායක | නිර්නායක සම්බන්ධ විස්තරය |
|---|---|
| 01.සේවා පළපුරුද්ද<br>(උපරිම ලකුණු 50) | **ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I ශ්‍රේණියේ (I පන්තියේ) සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ප්‍රදානය කෙරේ.**<br>I ශ්‍රේණියේ සතුටුදායක සේවා කාලයක් දීර්ඝතම කාලයක් ඇති නිලධාරීයාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන්කර ඇති මුළු ලකුණු ලබාදෙන අතර අනෙකුත් නිලධාරීිට එම ලකුණුවලට සමානුපාතිකව ඔවුන්ගේ සතුටුදායක සේවා කාලය සඳහා ගණනය කරන ලද ලකුණු ගණන ලබා දෙනු ලැබේ.<br><br>I ශ්‍රේණියේ දිර්ඝතම සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨ සේවා කාලය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු (අවුරුදු x12+ මාස) x අදාළ නිලධාරියාගේ I ශ්‍රේණියේ සතුටුදායක සේවා කාලය (අවුරුදු x12+ මාස) |
| 02. කුසලතාවය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා ලකුණු ප්‍රදානය කෙරේ.<br><br>(උපරිම ලකුණු 50) | **2.i..කෘෂිකාර්ම සංවර්ධනය සඳහා දායකත්වය (උපරිම ලකුණු 25)**<br><br>සම්මුඛ පරීක්ෂණ දිනයට පෙර වසර පහක කාලය තුල වාර්ෂික කාර්යය සාධන ඇගයීම්වලදි ලබා ගත් ශ්‍රේණිගත කිරීම් පහත පරිදි භාවිතා කරමින් ලකුණු ප්‍රදානය කෙරේ.<br><br>(වසරකට උපරිම ලකුණු **05** බැගින් වසර 05 ක් සඳහා ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය **25** කි)<br><br>**කාර්යය සාධන ඇගයීමේදී ලබා ගත් ශ්‍රේණිගත කිරීම්** — **වසරකට වෙන් කරන ලද උපරිම ලකුණු**<br>**විශිෂ්ඨයි** — **ලකුණු 05**<br>**සාමාන්‍යට වඩා වැඩි** — **ලකුණු 4.5 යි**<br>**සතුටුදායකයි** — **ලකුණු 4 යි** |
| | **2.ii.ප්‍රකාශන (උපරිම ලකුණු 08)**<br>**(ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය)**<br><br>(අ). ප්‍රකාශිත නිර්දේශිත සඟරා/පොත් සහ පොත් පරිච්ඡේද/පුහුණු මොඩියුල/විෂය මාලාවල කර්තෘවය<br>**(එකකට සඳහා උපරිම ලකුණු 01 අනුපාතිකයක්)**<br><br>(ආ). ප්‍රකාශිත සාරාංශ/පුහුණු ද්‍රව්‍ය/ නිර්දේශිත නොවන සඟරා/පුවත් පත්‍රිකා සහ සඟරාවල විද්‍යාත්මක ලිපි /අන්තර්ක්‍රියාකාරී සීඩී/වෙබ් ප්‍රකාශනවල කර්තෘත්වය)<br>**(එක් එක් කෘතියකට සඳහා උපරිම ලකුණු 0.5 අනුපාතයකින්)**<br><br>**අනුපිටපත් වීම වැළැක්වීම සඳහා (අ) හෝ (ආ) යටතේ එක් අයිතමයක් සලකා බලනු ලැබේ.** |
| | **2.iii.සම්මාන සහ ප්‍රශංසා (උපරිම ලකුණු 7)**<br>**(ලේඛනමය සාක්ෂි ඉදිරිපක් කළ යුතුය)**<br>➢ ප්‍රශංසා (ලකුණු ප්‍රදානය කරනු ලබන්නේ සාමාන්‍ය 230ආ ආකෘතියෙන් කරන ලද ප්‍රශංසා සඳහා පමණි)<br>(එක් එක් සඳහා උපරිම ලකුණු **i අනුපාතයට)**<br>➢ සම්මාන : සම්මාන සඳහා ලකුණු පහත පරිදි ප්‍රදානය කෙරේ.<br>➢<br><br>සම්මාන මට්ටම — එක් සම්මානයක් සඳහා පිරිනමන ලද ලකුණු ගණන<br>එක් සම්මානයක් සඳහා පිරිනමන ලද ලකුණු ගණන කෘෂිකාර්මික අංශයට දායකත්වය සඳහා ජාත්‍යන්තර සම්මාන — ලකුණු 2 යි<br>කෘෂිකාර්මික අංශයට දක්වන දායකත්වය සඳහා වන ජාතික සම්මාන (උදා - ජනාධිපති සම්මාන,ASDA හොඳම කෘෂිකාර්මඥයා/ විද්‍යාඥයා සම්මානය) — ලකුණු 2 යි<br>කෘෂිකාර්මික අංශයට දක්වන දායකත්වය සඳහා වන ජාතික/පළාත් මට්ටමේ විශේෂ සම්මාන (උදා - ඉහත සඳහන් සම්මානවලට අමතරව අනෙකුත් ASDA හොඳම සම්මානය) — ලකුණු 0.5 යි |
| | |

| | |
|---|---|
| | **2.iv.දුෂ්කර ප්‍රදේශවල සේවා පළපුරුද්ද (උපරිම ලකුණු 05)**<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වරින් වර සංශෝධනය කරන ලද දුෂ්කර ප්‍රදේශ ලැයිස්තුවට අනුව ලකුණු ලබා දෙනු ලැබේ (ඇමුණු III)<br><br>අතිශය දුෂ්කර ප්‍රෙද්ශය වසරකට ලකුණු 01 යි<br>දුෂ්කර ප්‍රෙද්ශය වසරකට ලකුණු 0.5 යි |
| | **2.v. සම්මුඛ පරීක්ෂණයේදී දක්ෂතාවය (උපරිම ලකුණු 05යි)**<br>( ක්ෂේත්‍රයට /ආයතනයට/මධ්‍යස්ථානයට අදාළ තනතුරේ අපේක්ෂකයින්ගේ ඉදිරිපත් කිරීම ඇගයීමෙන්)<br><br>**පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයේදී පෙන්නුම් කරන සන්නිවේදන කුසලතා, ආකල්ප, විශ්ලේෂණ කුසලතා මත පදනම්ව සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ප්‍රදානය කෙරේ.**<br><br>➢ **වත්මන් තත්ත්වය විශ්ලේෂණය කිරීම**<br>➢ **ගැටලු/අවශ්‍යතා හඳුනා ගැනීම සහ විසඳුම් යොජනා කිරීම**<br>➢ **හඳුනාගත් සීමාවන් ජය ගැනීම සඳහා උපාය මාර්ගික සැලසුම්**<br>➢ **සන්නිවේදන කුසලතා**<br>**(භාෂා හැකියාව අන් අයට අදහස් පැහැදිලි ප්‍රකාශ කිරීමේ හැකියාව)** |

| අතිශය දුෂ්කර ප්‍රදේශ | දුෂ්කර ප්‍රදේශ |
|---|---|
| අඩිඩාලච්චෙන | අම්බලන්තොට |
| අලුත්තාරාම | අම්පාර |
| අරලගංවිල | අඟුනකොලපැලැස්ස |
| බිබිල | අනුරාධපුර |
| ගිරාදුරුකෝට්ටේ | බදුල්ල |
| හංසයාපාලම | බණ්ඩාරවෙල |
| කල්පිටිය | බටාත |
| කන්තලේ | මඩකලපුව |
| කරදියනාරු | බෙන්තොට |
| කිලිනොච්චිය | බිදුණුවැව |
| මදුරුකැටිය | හම්බන්තොට |
| මල්වත්ත | හසලක |
| මොනරාගල | යාපනය |
| මුලතිව් | මහඉලුප්පල්ලම |
| මුරුන්කන් | නිකවැරටිය |
| මුතුකණ්ඩිය | නුවරඑළිය |
| පලමුනේ | පොළොන්නරුව |
| පරන්තන් | කරපිංචා |
| රහංගල | සීතාඑළිය |
| සමන්තුරේ | ත්‍රිකුණාමලය |
| තිරුනාල්වේලි | වව්නියාව |
| වනාතවිල්ලුව | |
| වාවින්න | |
| වීරවිල | |

## අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කිරීමේ ලකුණු ලබා දීමේ යෝජනා ක්‍රමය (මුළු ලකුණු100)

<table>
<tr><th>නිර්නායක</th><th>නිර්නායක සම්බන්ධ විස්තරය</th></tr>
<tr><td>01.සේවා පළපුරුද්ද<br>(උපරිම ලකුණු 50)</td><td>

**ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I ශ්‍රේණියේ (I පන්තියේ) සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ප්‍රදානය කෙරේ.**

I ශ්‍රේණියේ සතුටුදායක සේවා කාලයක් දීර්ඝතම කාලයක් ඇති නිලධාරීයාට ජොෂ්ඨතාවය සඳහා වෙන්කර ඇති මුළු ලකුණු ලබාදෙන අතර අනෙකුත් නිලධාරීන්ට එම ලකුණුවලට සමානුපාතිකව ඔවුන්ගේ සතුටුදායක සේවා කාලය සඳහා ගණනය කරන ලද ලකුණු ගණන ලබා දෙනු ලැබේ.

I ශ්‍රේණියේ දිර්ඝතම සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාගේ ජොෂ්ඨ සේවා කාලය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු x අදාළ නිලධාරියාගේ I ශ්‍රේණියේ සතුටුදායක සේවා කාලය<br>
(අවුරුදු x12+ මාස) (අවුරුදු x12+ මාස)

</td></tr>
<tr><td>02. කුසලතාවය<br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා ලකුණු ප්‍රදානය කෙරේ.<br><br>(උපරිම ලකුණු 50)</td><td>

**2.i..කෘෂිකර්ම සංවර්ධනය සඳහා දායකත්වය (උපරිම ලකුණු 25)**

සම්මුඛ පරීක්ෂණ දිනයට පෙර වසර පහක කාලය තුල වාර්ෂික කාර්යය සාධන ඇගයීම්වලදී ලබා ගත් ශ්‍රේණිගත කිරීම් පහත පරිදි භාවිතා කරමින් ලකුණු ප්‍රදානය කෙරේ.<br>
(වසරකට උපරිම ලකුණු **05** බැගින් වසර 05 ක් දහා ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය **25** කි)

<table>
<tr><th>කාර්යය සාධන ඇගයීමේදී ලබා ගත් ශ්‍රේණිගත කිරීම්</th><th>වසරකට වෙන් කරන ලද උපරිම ලකුණු</th></tr>
<tr><td>විශිෂ්ඨයි</td><td>ලකුණු 05</td></tr>
<tr><td>සාමාන්‍යට වඩා වැඩි</td><td>ලකුණු 4.5 යි</td></tr>
<tr><td>සතුටුදායකයි</td><td>ලකුණු 4 යි</td></tr>
</table>

**2.ii.ප්‍රකාශන (උපරිම ලකුණු 08)**<br>
**(ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය)**

(අ). ප්‍රකාශිත නිර්දේශිත සගරා/පොත් සහ පොත් පරිච්ඡේද/පුහුණු මොඩියුල/විෂය මාලාවල කර්තෘවය<br>
**(එකකට සඳහා උපරිම ලකුණු 01 අනුපාතිකයක්)**

(ආ). ප්‍රකාශිත සාරාංශ/පුහුණු ද්‍රව්‍ය/ නිර්දේශිත නොවන සඟරා/පුවත් පත්‍රිකා සහ සඟරාවල විද්‍යාත්මක ලිපි /අන්තර්ක්‍රියාකාරී සීඩී/වෙබ් ප්‍රකාශනවල කර්තෘත්වය)<br>
**(එක් එක් කෘතියකට සඳහා උපරිම ලකුණු 0.5 අනුපාතයකින්)**

**අනුපිටපත් වීම වැළැක්වීම සඳහා (අ) හෝ (ආ) යටතේ එක් අයිතමයක් සලකා බලනු ලැබේ.**

</td></tr>
<tr><td></td><td>

**2.iii.සම්මාන සහ ප්‍රශංසා (උපරිම ලකුණු 7)**<br>
**(ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය)**

- ප්‍රශංසා (ලකුණු ප්‍රදානය කරනු ලබන්නේ සාමාන්‍ය 230ආ ආකෘතියෙන් කරන ලද ප්‍රශංසා සඳහා පමණි)<br>(එක් එක් සඳහා උපරිම ලකුණු **i අනුපාතයට)**
- සම්මාන : සම්මාන සඳහා ලකුණු පහත පරිදි ප්‍රදානය කෙරේ.

<table>
<tr><th>සම්මාන මට්ටම</th><th>එක් සම්මානයක් සඳහා පිරිනමන ලද ලකුණු ගණන</th></tr>
<tr><td>එක් සම්මානයක් සඳහා පිරිනමන ලද ලකුණු ගණන කෘෂිකාර්මික අංශයට දායකත්වය සඳහා ජාත්‍යන්තර සම්මාන</td><td>ලකුණු 2 යි</td></tr>
<tr><td>කෘෂිකාර්මික අංශයට දක්වන දායකත්වය සඳහා වන ජාතික සම්මාන<br>(උදා - ජනාධිපති සම්මාන,ASDA හොඳම කෘෂිකාර්මඥයා/ විද්‍යාඥයා සම්මානය)</td><td>ලකුණු 2 යි</td></tr>
<tr><td>කෘෂිකාර්මික අංශයට දක්වන දායකත්වය සඳහා වන ජාතික/පළාත් මට්ටමේ විශේෂ සම්මාන<br>(උදා - ඉහත සඳහන් සම්මානවලට අමතරව අනෙකුත් ASDA හොඳම සම්මානය)</td><td>ලකුණු 0.5 යි</td></tr>
</table>

</td></tr>
</table>

| | |
|---|---|
| | **2.iv.දුෂ්කර ප්‍රදේශවල සේවා පළපුරුද්ද (උපරිම ලකුණු 05)**<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වරින් වර සංශෝධනය කරන ලද දුෂ්කර ප්‍රදේශ ලැයිස්තුවට අනුව ලකුණු ලබා දෙනු ලැබේ (ඇමුණුම III)<br><br>අතිශය දුෂ්කර ප්‍රෙද්ශය වසරකට ලකුණු 01 යි<br>දුෂ්කර ප්‍රදේශය වසරකට ලකුණු 0.5 යි |
| | **2.v. සම්මුඛ පරීක්ෂණයේදී දක්ෂතාවය (උපරිම ලකුණු 05යි)**<br>( ක්ශේත්‍රයට /ආයතනයට/මධ්‍යස්ථානයට අදාළ තනතුරේ අපේක්ෂකයින්ගේ ඉදිරිපත් කිරීම ඇගයීමෙන්)<br><br>**පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයේදී පෙන්නුම් කරන සන්නිවේදන කුසලතා, ආකල්ප, විශ්ලේෂණ කුසලතා මත පදනම්ව සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ප්‍රදානය කෙරේ.**<br><br>➢ **වත්මන් තත්ත්වය විශ්ලේෂණය කිරීම**<br>➢ **ගැටලු/අවශ්‍යතා හඳුනා ගැනීම සහ විසඳුම් යොජනා කිරීම**<br>➢ **හඳුනාගත් සීමාවන් ජය ගැනීම සඳහා උපාය මාර්ගික සැලසුම්**<br>➢ **සන්නිවේදන කුසලතා**<br>**(භාෂා හැකියාව අන් අයට අදහස් පැහැදිලිව ප්‍රකාශ කිරීමේ හැකියාව)** |

| අතිශය දුෂ්කර ප්‍රදේශ | දුෂ්කර ප්‍රදේශ |
|---|---|
| අඩ්ඩාලච්චෙන | අම්බලන්තොට |
| අලුත්තාරාම | අම්පාර |
| අරලගංවිල | අඟුනකොලපැලැස්ස |
| බිබිල | අනුරාධපුර |
| ගිරාදුරුකෝට්ටේ | බදුල්ල |
| හංසයාපාලම | බණ්ඩාරවෙල |
| කල්පිටිය | බටාත |
| කන්තලේ | මඩකලපුව |
| කරදියනාරු | බෙන්තොට |
| කිලිනොච්චිය | බිඳුණුවැව |
| මදුරුකැටිය | හම්බන්තොට |
| මල්වත්ත | හසලක |
| මොනරාගල | යාපනය |
| මුලතිව් | මහඉලුප්පල්ලම |
| මුරුන්කන් | නිකවැරටිය |
| මුතුකණ්ඩිය | නුවරඑළිය |
| පලමුනේ | පොළොන්නරුව |
| පරන්තන් | කරපිංචා |
| රහංගල | සීතාඑළිය |
| සමන්තුරේ | ත්‍රිකුණාමලය |
| තිරුනාල්වේලි | වව්නියාව |
| වනාතවිල්ලුව | |
| වාවින්න | |
| වීරවිල | |

**<u>නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා ලකුණු කිරීමේ යෝජනා ක්‍රමය (මුළු ලකුණු - 100)</u>**

<table>
<tr><th>නිර්නායක</th><th>නිර්නායක සම්බන්ධ විස්තරය</th></tr>
<tr><td>01.සේවා පළපුරුද්ද<br>(උපරිම ලකුණු 50)</td><td>ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I ශ්‍රේණියේ (I පන්තියේ) සහ II ශ්‍රේණියේ (II/I පන්තිය) සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ප්‍රදානය කෙරේ.<br><br>I ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ දීර්ඝතම සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන්කර ඇති මුළු ලකුණු ලබාදෙන අතර අනෙකුත් නිලධාරීන්ට එම ලකුණුවලට සමානුපාතිකව ඔවුන්ගේ සතුටුදායක සේවා කාලය සඳහා ගණනය කරන ලද ලකුණු ගණන ලබා දෙනු ලැබේ.<br><br>I ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ දීර්ඝතම සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරියාට ජ්‍යෂ්ඨත්වය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ලබා දෙන අතර අනෙකුත් නිලධාරීන්ට එම ලකුණුවලට සමානුපාතිකව ඔවුන්ගේ සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ගණන කරන ලද ලකුණු ගණන ලබා දෙනු ලැබේ.<br>(අවුරුදු x12+ මාස)<br>x<br>නිලධාරියාගේ I ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ සතුටුදායක සේවා කාලය සඳහා ලබා දී ඇති උපරිම ලකුණු, දීර්ඝතම සේවා කාලය<br>(අවුරුදු x12+ මාස)</td></tr>
<tr><td>02. කුසලතාවය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා ලකුණු ප්‍රදානය කෙරේ.<br><br>(උපරිම ලකුණු 50)</td><td>2.i..කෘෂිකාර්ම සංවර්ධනය සඳහා දායකත්වය (උපරිම ලකුණු 25)<br><br>සම්මුඛ පරීක්ෂණ දිනයට පෙර වසර පහක කාලය තුල වාර්ෂික කාර්යය සාධන ඇගයීම්වලදි ලබා ගත් ශ්‍රේණිගත කිරීම් පහත පරිදි භාවිතා කරමින් ලකුණු ප්‍රදානය කෙරේ.<br><br>(වසරකට උපරිම ලකුණු 05 බැගින් වසර 05 ක් සඳහා ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය 25 කි)<br><br>
<table>
<tr><th>කාර්යය සාධන ඇගයීමේදී ලබා ගත් ශ්‍රේණිගත කිරීම්</th><th>වසරකට වෙන් කරන ලද උපරිම ලකුණු</th></tr>
<tr><td>විශිෂ්ඨයි</td><td>ලකුණු 05</td></tr>
<tr><td>සාමාන්‍යට වඩා වැඩි</td><td>ලකුණු 4.5 යි</td></tr>
<tr><td>සතුටුදායකයි</td><td>ලකුණු 4 යි</td></tr>
</table></td></tr>
<tr><td></td><td>2.ii.ප්‍රකාශන (උපරිම ලකුණු 08)<br>(ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය)<br>(අ). ප්‍රකාශිත තීරක සගරා/පොත් සහ පොත් පරිච්ඡේද/පුහුණු මොඩියුල/විෂය මාලාවල කර්තෘවය<br>(එකකට උපරිම ලකුණු 01 බැගින්)<br>(ආ). ප්‍රකාශිත සාරාංශ/පුහුණු ද්‍රව්‍ය/ නිර්දේශිත නොවන සඟරා/පුවත් පත්‍රිකා සහ සඟරාවල විද්‍යාත්මක ලිපි /අන්තර් ක්‍රියාකාරී සීඩී/වෙබ් ප්‍රකාශනවල කර්තෘත්වය)<br>(එක් එක් කෘතියකට උපරිම ලකුණු 0.5 බැගින්)<br><br>ඕනෑම ප්‍රකාශයක් සඳහා ලකුණු ලබා දෙනු ලබන්නේ එක් කාණ්ඩයක් යටතේ පමණි.</td></tr>
<tr><td></td><td>2.iii.සම්මාන සහ ප්‍රශංසා (උපරිම ලකුණු 7)<br>(ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය)<br><br>➢ ප්‍රශංසා (සාමාන්‍ය 230 ආ ආකෘතියෙන් කරන ලද ප්‍රශංසා සඳහා පමණි)<br>(එක් අයෙකුට උපරිම ලකුණු 1 බැගින්)<br><br>➢ සම්මාන : සම්මාන සඳහා ලකුණු පහත පරිදි ප්‍රදානය කෙරේ.
<table>
<tr><th>සම්මාන මට්ටම</th><th>එක් සම්මානයක් සඳහා පිරිනමන ලද ලකුණු ගණන</th></tr>
<tr><td>එක් සම්මානයක් සඳහා පිරිනමන ලද ලකුණු ගණන කෘෂිකාර්මික අංශයට දායකත්වය සඳහා ජාත්‍යන්තර සම්මාන</td><td>ලකුණු 2 යි</td></tr>
<tr><td>කෘෂිකාර්මික අංශයට දක්වන දායකත්වය සඳහා වන ජාතික සම්මාන<br>(උදා - ජනාධිපති සම්මාන,ASDA හොඳම කෘෂිකාර්මඥයා/ විද්‍යාඥයා සම්මානය)</td><td>ලකුණු 2 යි</td></tr>
<tr><td>කෘෂිකාර්මික අංශයට දක්වන දායකත්වය සඳහා ජාතික/පළාත් මට්ටමේ විශේෂ සම්මාන<br>(උදා - ඉහත සඳහන් සම්මානවලට අමතරව අනෙකුත් ASDA සම්මානය)</td><td>ලකුණු 0.5 යි</td></tr>
</table></td></tr>
</table>

| | |
|---|---|
| | **2.iv.දුෂ්කර දුෂ්කර ප්‍රදේශවල සේවා පළපුරුද්ද (උපරිම ලකුණු 05)**<br><br>දුෂ්කර ප්‍රදේශ ලැයිස්තුවට අනුව ලකුණු ලබාදෙනු ලැබේ. (ඇමුණුම I) දෙපාර්තමේන්තුව විසින් කලින් කලට සංශෝධනය කරනු ලැබේ.<br><br>අතිශය දුෂ්කර ප්‍රදේශය වසරකට ලකුණු 01 යි<br>දුෂ්කර ප්‍රදේශය වසරකට ලකුණු 0.5 යි |
| | **2.v. සම්මුඛ පරීක්ෂණයේදී දක්ෂතාවය (උපරිම ලකුණු 05යි)**<br>( ක්ශේත්‍රයට /ආයතනයට/මධ්‍යස්ථානයට අදාළ තනතුරේ අපේක්ෂකයින්ගේ ඉදිරිපත් කිරීම ඇගයීමෙන්)<br><br>**පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයේදී පෙන්නුම් කරන සන්නිවේදන කුසලතා, ආකල්ප, විශ්ලේෂණ කුසලතා මත පදනම්ව සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ප්‍රදානය කෙරේ.**<br><br>➢ **වත්මන් තත්ත්වය විශ්ලේෂණය කිරීම**<br>➢ **ගැටලු/අවශ්‍යතා හඳුනා ගැනීම සහ විසඳුම් යෝජනා කිරීම**<br>➢ **හඳුනාගත් සීමාවන් ජය ගැනීම සඳහා උපාය මාර්ගික සැලසුම්**<br>➢ **සන්නිවේදන කුසලතා**<br>**(භාෂා හැකියාව අන් අයට අදහස් පැහැදිලි ප්‍රකාශ කිරීමේ හැකියාව)** |

| අතිශය දුෂ්කර ප්‍රදේශ | දුෂ්කර ප්‍රදේශ |
|---|---|
| අඩිඩාලව්වෙන | අම්බලන්තොට |
| අලුත්තාරාම | අම්පාර |
| අරලගංවිල | අඟුනකොලපැලැස්ස |
| බිබිල | අනුරාධපුර |
| ගිරාදුරුකෝට්ටේ | බදුල්ල |
| හංසයාපාලම | බණ්ඩාරවෙල |
| කල්පිටිය | බටාත |
| කන්තලේ | මඩකලපුව |
| කරදියනාරු | බෙන්තොට |
| කිලිනොච්චිය | බිදුණුවැව |
| මදුරුකැටිය | හම්බන්තොට |
| මල්වත්ත | හසලක |
| මොනරාගල | යාපනය |
| මුලතිව් | මහඉලුප්පල්ලම |
| මුරුන්කන් | නිකවැරටිය |
| මුතුකණ්ඩිය | නුවරඑළිය |
| පලමුනේ | පොළොන්නරුව |
| පරන්තන් | කරපිංචා |
| රහංගල | සීතාඑළිය |
| සමන්තුරේ | ත්‍රිකුණාමලය |
| තිරුනාල්වේලි | වව්නියාව |
| වනාතවිල්ලුව | |
| වාවින්න | |
| වීරවිල | |